## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. තත්ත්වාගණනය කළ මතය

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාහාරයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් හා වියදම් ප්‍රකාශනය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1986 අංක 03 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාහාරය පනතේ 11 (4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාහාරයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාහාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාහාරය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාභාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාභාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාභාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාභාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාභාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාහාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාහාරයේ භාරකාර මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාහාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි ඡේද අංක 08 හා 56 අනුව භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 ක කාලයක් තුළදී කල් පිරීමට නියමිත එකතු වටිනාකම රු.5,860,049 ක් වූ භාණ්ඩාගාර බිල්පත්‍ර 03 ක් සහ ත්‍රෙයි මාසික ස්ථාවර තැන්පතුවක වටිනාකම වූ රු.1,000,000 ක් මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස සටහන් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදිව ගිණුම් ප්‍රමිත අනුව සටහන් කිරීමට කටයුතු කරමි. . | මෙම ප්‍රමිතය සහ පිළිතුර ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) අරමුදල් ගිණුම් 02 පිළිබඳ තොරතුරු | 1,462,778 | ඉටුකළ යුතු අරමුණු හා කාර්යයන් පිළිබඳ ලිඛිත තහවුරුවක් | මේ සම්බන්ධව ඉදිරියේදී භාරකාර මණ්ඩලය වෙත භාරකාර මණ්ඩල පත්‍රිකාවක් යොමු කර කටයුතු කරමි. | අරමුදල් පිහිටුවීමට අදාළ අරමුණු පිළිබඳව සොයා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු බව. |
| (ආ) ගෙවීම් වවුචර් පත්‍ර | 869,000 | ගෙවීම් වවුචර් පත්‍ර 03 ක් ඉදිරිපත් නොකිරීම | මෙම වවුචර් ගොණුගත කිරීමේදී අස්ථානගත වීමක් සිදුව ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියළු ගෙවීම් වවුචර් පත්‍ර නොපමාව විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරය පනත | | | |
| (i) 3 (1) සහ (2) වගන්ති | භාරයෙහි කළමනාකරණය හා පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කළ යුතු වුවත්, 2013 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. | 2013 වර්ෂයේ සිට භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබූ අතර, 2021 වර්ෂයේ සිට පත්කර ඇත. | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii) 5 (1) වගන්තිය | චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයන්ට ආධාර වන පරිදි සැලසුම් කරන ලද සුභසාධන අරමුදල්, ඉතිරිකිරීමේ අරමුදල්, ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවා නොතිබුණි. | මූල්‍ය දුෂ්කරතා සහ භාරකාර මණ්ඩලයක් නොතිබීම වැනි කරුණු මත මෙම පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | -එම- |
| (iii) 5 (2) (අ) වගන්තිය | සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට ණය, දීමනා, නිවාස පහසුකම් හෝ වෙනත් සමාන ප්‍රතිලාභ ලබාදීමට අවධානය යොමු කර නොතිබුණි. | මූල්‍ය දුෂ්කරතා සහ භාරකාර මණ්ඩලයක් නොතිබීම වැනි කරුණු මත මෙම පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | -එම- |
| (iv) 5 (2) (ආ) වගන්තිය | යම් කායික හෝ මානසික දුබලතාවයකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටින සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට යම් මුදල් ආධාරයක් පිරිනැමීමට ක්‍රියා කර නොතිබුණි. | මූල්‍ය දුෂ්කරතා සහ භාරකාර මණ්ඩලයක් නොතිබීම වැනි කරුණු මත මෙම පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | -එම- |
| (v) 6 (2) (අ) වගන්තිය | අරමුදල් උපයා ගැනීමට සුදුසු වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | භාරකාර මණ්ඩලයක් නොතිබීම මත කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | -එම- |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1ඡේදය මඟින් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 877(1)(ඇ) | සංස්ථාභාරයේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු දී නොමැත. | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 877(2)(ඈ) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාභාරයේ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 ජනවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසුව ඉදිරිපත් කළ යුතු වූ බැවින් 2020 ගිණුම් ප්‍රමාද විය. . | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 245 සහ 257 | සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම් වවුචර් පත්‍ර 10 ක් භාවිතා කර එකතුව රු.1,644,200 ක් වියදම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ජාතික චිත්‍රපට සංස්ථාභාරයේ 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.10,884 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.530,045 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.519,161 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා විශ්‍රාම වැටුප් දීමනාව රු.310,000 කින් ඉහළ යාම හා භාණ්ඩාගාර ලැබීම් රු.315,000 කින් පහළ යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.